

මව්බිමෙන් බැහැරව සිට මව්බසින් ලිවීම එක්තරා විදියක අභියෝගයකි. දිගු කලක් මව් රටින් බැහැරව සිටින්නෙකු මව්බසින් මේ රටේදී ලත් අත්දැකීම් පසුබිම් කරගෙන නිර්මාණයේ යෙදීම තවත් අභියෝගයකි. මෙසේ ලියන දෙය සාර්ථකව ලිවීම මේ සියළු කරුණු අභිබවා සිටින අභියෝගයකි. මෙසේ ලියන්නට සිතුනේ මෙවන් අභියෝගයකට මුහුණ දී එය ජයගත් සිදුවීමක් මට අත්දකින්නට ලැබුණු අවස්ථාවක් නිසාය. එය ආස්වාදජනක තනිකම හා අසරණ බව පෙන්වන කතාවකි "එක්තරා කුරුළු කූඩුවක්" නමින් හැඳින්වෙන්නේ. ඕස්ට්‍රේලියන් ආදිවාසී ජනකාය සුදු ජාතිකයන්ගේ ග්‍රහණයට අසුවීමෙන් ඔවුන්ගේ වේදනාව "ඩිපිරිඩුවක දෝංකාරය" කතාවෙන් නිරූපණය වෙයි. තම කෙටිකතාව සඳහා තෝරාගත් වස්තු බීජය සාර්ථක නිර්මාණයක් දක්වා විකාශනය කිරීමට ලක්ෂමන් සතු කුසලතාව මේ කතා එකතුවේ බොහෝමයක් තුළින් දක්නට ලැබේ. "මොහොඩ් ගේ කතා වස්තුව", "සඳෙන් උපන් මුණුබුරෙක්", " ආදරයයි සාගරයයි" යන කතා තුළින් ලක්ෂමන්ගේ මේ කුසලතාව මනාව මතුවී පෙනේ. සංවේතාත්මක සිදුවීම් හරහා කතාවක වස්තු බීජය විකාශනය කිරීමට ලක්ෂමන් සාර්ථක උත්සහයක යෙදෙයි. " එක්තරා කුරුළු කූඩුවක්" කතාව කියවන සහෘදයාට, ජීවිතයේ සැඳෑ සමය තනිව පාළුවෙන් ගෙවන වැඩිමහළු යුවලගේ ජීවිතයත් බිරිඳ ආදරයෙන් ඇති දැඩි කරන කුරුළු ජෝඩුවත් අතර ඇති සමීප සම්බන්ධතාව පිළිබඳ හැඟීමක් ඇතිවෙයි. "සඳෙන් උපන් මුණුබුරෙක්" කතාවේ මව්බිමෙන් බැහැරව වෙසෙන කමලාවතී හාමිනේගේ කායික හා මානසික දුරස්ථභාවයක් මුනුබුරා දැකීමේ ආසාව තුළින් අයය මෙරට රඳවා ගැනීමත් වළාකුළු අතරින් මතුවී එන සඳ මගින් සංකේතවත් වෙයි.

ඩිපිරිඩුවක දෝංකාරය ඕස්ට්‍රේලියාවේ ආදිවාසී අබරිජිත ජාතිකයන්ගේ අනාථ බව පෙන්වන නිර්මාණයකි. මේ කතාවේ ප්‍රධාන චරිතය වන 'පින්ගු' ජනකිරීණ තැන්වල ස්වකීය ඩිපිරිඩුව .... ලැබෙන සුළු මුදලින් ඔත්පලව සිටින තම බිරිඳ රැකබලා ගනී. දිනක් බීමත්ව රන්ඩුවකට පැටලෙන 'පින්ගු' සිරබාරයට ගැනීමෙන් කතාව ශෝකජනක ලෙස අවසන් වෙයි.

පරමේශ්වරී ඔසී සිංහල සාහිත්‍යයට පිවිසෙයි

අත්දැකීම මට ලැබුනේ ලක්ෂමන් කොඩිතුවක්කුගේ 'පරමේශ්වරී සහ වෙනම රටක්' නැමැති කෙටිකතා සංග්‍රහය කියවීමත් සමගයි.

පුවත් පත් කලාවේදියෙකු හා කවියෙකු වන ලක්ෂමන් කොඩිතුවක්කු කෙටිකතා කරුවකු ලෙසින් දොරට වඩින්නේ ඔහුගේ මෙම පළමු කෙටිකතා සංග්‍රහ පළවීමත් සමගය.

කෙටිකතා දහයකින් සමන්විත ලක්ෂමන්ගේ පොත විවිධ අත්දැකීම් පාදක කර ගත් විවිධ තේමාවන් හරහා ප්‍රමුඛ් පරාසයක් කරා විහිදයි.
මෙයින් කතා පහකට පාදක වී ඇත්තේ ශ්‍රී ලංකාවේදී කතුවරයා ලත් අත්දැකීම්ය. මෙරටදී මුහුණ දුන් සිදුවීම් අනෙක් කතා පහට වස්තු වී ඇත.

යොවුන් ආදරයේ හැඟුම් බවත්, ආදරයේ නාමයෙන් කාන්තාවන් අසරණ වන සැටිත් "ආදරයයි සාගරයයි" හා "ආදරවන්තයෝ" යන කතා දෙකට පාදක වී ඇත. "සඳෙන් උපන් මුණුපුරෙක්" නැමැති කෙටිකතාව මෙරටට ළඟාවන වැඩිහිටියන් මුහුණදෙන සුලබ අත්දැකීමක් පසුබිම් කරගෙන ඇතත් ලක්ෂමන් යොදාගත් බස් වහරත් භාෂා ප්‍රයෝගත් නිසා ඒ කතාවට අපූර්වත්වයක් ලැබී ඇත.

"මෙලොවදී හමුවීමක්" කතාව ශ්‍රී ලංකාවේ අසූව දශකයේ පැවති හීෂණ සමයේ අත්දැකීම් අපට සිහිකරවන්නකි. ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේදී මියගිය සෙබලෙකු සිහි කරනු පිණිස ඉදිකළ නගරයේ බස් නැවතුම් පොළ වටා පොකුණ "විරයෙකුගේ නවාතැන් පොළ" නැමැති කතාව වේදිකා නාට්‍යයක ජවනිකා කිහිපයක් වැන්න.
"මොහොඩ්ගේ කතා වස්තුව" එදා වේල හම්බකරගනිමින් කොළඹ අවට ජීවත් වන දිළිඳු කම්කරු ජනකායගේ ජීවිතයේ එක් පැතිකඩක් විවරණය කරයි. කලාව වාණිජත්වය මගින් ඩැහැගන්නා හැටිත්, කලාව පාවාදීමට ඉදිරිපත් නොවන අවංක කලාකරුවන් අසරණ වන හැටිත් පෙන්වන්නක්

"චිත්තරකාරයා" නැමැති කෙටිකතාව. 'පරමේශ්වරී සහ වෙනම රටක්' කතාවට වස්තු වන්නේ ශ්‍රී ලංකා සිවිල් යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙසින් මෙරටට පැමිණි පරමේශ්වරී නැමැති දෙමළ තරුණිය මුහුණ දුන් අත්දැකීමකි. මෙරට ජීවත්වන වැඩිහිටි යුවළකගේ මේ කතාවට තෝරාගෙන ඇති අගනා වස්තු බීජය තුළ කතුවරයා අතරමං වී ඇතැයි ඒ කතාව කියවීමේදී මට සිතිණ. කතා විකාශනය තුළින් ආදිවාසීන්ගේ ශෝකජනක ඉරණම නිරූපනය කරනු වෙනුවට කතා නායකයා (පින්ගු) ලවා කතාවේ අරමුණ කියවීම තුළින් කතුවරයා කතාව තුළින් ඉස්මතු වේ.

ලක්ෂමන්ගේ කතා බොහෝමයක් සාර්ථක නිර්මාණ වීමට හේතුවී ඇති ප්‍රධාන කරුණක් නම් ඔහු යොදාගත් ධීවනිතාර්ථ නගන භාෂා ප්‍රයෝගයි. කවියක මෙන් පාඩකයා සිත තුළ චිත්ත රූපයක් මැවීමට ..... භාෂා ප්‍රයෝග සමත් වේ. නිදසුන් කිහිපයක් මෙසේයි.

"ඔහු මගින් බැස මට අතවනා බස්සේ වේගවත් සමග ඇතට ඇදී ගියේය." (පිට 22)
"එයට පිළිතුර නොදුන් මගේ සිත අම්මාගේ රුව අසල නතර විණි. (පිට 23)
"ඇංශභාග රෝගයෙන් ඔත්පළව ලෑළි ඇඳේ උඩුකුරුවෙ හිසොල්මන්ව සිටින සමරේ අයියා කඩා වැටුණු පිළිමයක් සේ ඔහු දෙස බලා සිටි. (පිට 66)
"සැමදා මගින් අසුන් ගන්නා බසයක පහළට එබී දිරන..... වී වක ගැසුණු ආසන කබලක් සේම, ඔහුගේ කම්මුල් ද හකු පාඩාවලට පිපෙන්නට ඉඩ දී ඇතුළට නෙරා ඇත. (පිට 73)

කවියෙකුද වන ලක්ෂමන් කොඩිතුවක්කු ස්වකීය කවි ශක්තිය උපයෝගී කරගෙන මෙන් දිගු කතන්දරයක් සංක්ෂිප්තව කීමට දරා ඇති ප්‍රයත්නය ප්‍රශංසනීයයි. "වුලසිංහගේ ආදරය දැන් මට ඉරහඳ මෙන් විශ්වාසයි. ඒ විශ්වාසය හමුවේ මා දැන් ගැඹිනියකි. (පිට 25)

ලේඛකයෙකුගේ පළමු කෙටි කතා පොත, බොහෝ විට ආධුනික නිර්මාණයක් ලෙස සැලකීමට පුරුදු වී තිබීම ශ්‍රී ලංකික සමාජය තුළ දක්නට ලැබේ. මේ මතය ලක්ෂ්මන්ගේ කෙටි කතා සංග්‍රහය පිළිබඳව සාවද්‍යය "පරමේශ්වරී සහ වෙනම රටක්" ප්‍රවීන ගත්කතුවරයකුගේ පරිණත නිර්මාණයක් ලෙස පාඨක විචාරක දෙපක්ෂයේම අවධානයට යොමු විය යුතුය.

ආචාර්ය පාලිත ගනේවත්ත

Face the
CHANGE
in Australian Immigration

Latest Facts

Australian Government announced the Migration Program for financial year 2010-2011 and there will be 113 850 places for skill migration program (General Skill Migration, Employer Sponsored Skill Migration, Business Skill Migration, Distinguished Talent visas)

A new Skill Occupation List (SOL) has been introduced with 196 Occupations that has come in to effect from 1 July 2010. The previous SOL, originally introduced in 1999, with over 400 Occupations ceased on 30th June 2010

A new Skill Occupation List (SOL) has been introduced with 492 Occupations for State & Territory Nominated General Skill Migration visa subclass that has come in to effect from 1 July 2010.

Australian Govt. temporarily suspended accepting off-shore General Skill Migration (GSM) Applications (for applicants outside Australia) on 8th May 2010 and re-opened on 1 July 2010

Overseas Students who held or made a valid application for subclass 485 – Graduate Skill Visa before 8th February 2010, are also Eligible to apply for Permanent Residence by 31st December 2012

Overseas Students who hold a valid student visa subclass 572, 573, 574 completing the Australian qualifications in Australia are also eligible to apply for subclass 485 – Graduate Skill Visas by 31st December 2012

Those applicants for 485 who do not fall in to the new skill occupation list may be able to obtain their Permanent Residence eventually on Employer Nomination Scheme (ENS) & Employer Nominated visa applications are the top priority for visa grants of the Australian Government.

GUSS DESIGN 0769 0099

TO MEET THE CHALLENGES WITH THE LATEST CHANGES, YOU ARE WELCOME TO CONTACT

Susantha Katugampala LL B (Monash)
Barrister & Solicitor
MARN: 9601070
Accredited Immigration Law Specialist

Susantha Katugampala, and the rest of the TEAM OF LAWYERS & THE STAFF from Australia or Sri Lanka, dedicated to provide you the best advice and service.

COLOMBO OFFICE:
AUSTRALIA GATEWAY
Australian Migration Consultants
HILTON RESIDENCIES
Union Place, Colombo 2
Tel: +94 11 2300 627
+94 777 347 670

MELBOURNE OFFICE:
FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
10 Morrison Place
Melbourne East
Tel: +61 3 9650 4557
+61 417 851041

Skill Migration | Business Migration | State Sponsorships
Family Migration | Spouse Visas | Parent Visas | MRT Appeals

We Deliver Results..